# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,343 - 2023 ජූලි මස 28 වැනි සිකුරාදා - 2023.07.28**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | — |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | 482 |
| විවිධ දැන්වීම් ... ... ... ... | 482 |


*සැ. යු.-* (i) සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත 2023 ජූලි මස 14 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) ජ්‍යෙෂ්ඨ උපදේශක නීතිඥ බහුමානය ප්‍රදානය කිරීමේ පනත් කෙටුම්පත 2023 ජූලි මස 14 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත 2023 ජූලි මස 14 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට නෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2023 අගෝස්තු මස 18 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 අගෝස්තු මස 04 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


481 - B 082477 — 353 (2023/07)
D 1 -

# නොතාරිස් ලැයිස්තුව

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

දැන්වීමයි

**107 අධිකාරය වන නොතාරිස් ආඥාපනත**

කොළඹ මහාධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කළ දොන් ජෝතිරත්න ජයසිංහ මහතා, 2022.12.16 දින සිට ධුරයෙන් ඉල්ලා අස්වීම රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා විසින් අනුමත කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

කේ. ඩී. එන්. රංජිත් අසෝක,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා
හා පළාත් පාලන අමාත්‍යාංශය.

2023 ජුනි මස 30 වැනි දින,
කොළඹ දී ය.

07-294

---

# විවිධ දැන්වීම්

**ස්වකීය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාතේ පළාත්බද (වාණිජ) මහාධිකරණයේ දී ය**

ගණන් බේරා වසා දැමීම පිළිබඳ දැන්වීම

නඩු අංකය : CHC 33/2023 CO
ස්වභාවය : ඈවර කිරීම
පටිපාටිය : ලඝු

කොළඹ 04, බෞද්ධාලෝක මාවත, අංක 102 හි තම ලියාපදිංචි කාර්යාලය පිහිටි (ලියාපදිංචි අංක PV 17260) ඒෂියා ලෙෂර් (ප්‍රයිවට්) ලිමිටඩ් Asia Leisure (Private) Limited සම්බන්ධ කාරණයේ දී ය.

*සහ*

2007 අංක 07 දරන සමාගම් පනතේ XII පරිච්ඡේදයේ 270 (ඉ) සහ 270 (ඊ) වගන්ති යටතේ සහ ප්‍රකාර ව ඒෂියා ලෙෂර් (ප්‍රයිවට්) ලිමිටඩ් ඈවර කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම සම්බන්ධ කාරණයේ දී ය.

1. මීස්ටන් අමරසිරි ගුණවර්ධන,
අංක 151/16, 1 වන පටුමග,
රත්තනපිටිය, බොරලැස්ගමුව.

2. ශිරානි නිරංජලා ගුණවර්ධන,
අංක 151/15, 1 වන පටුමග,
රත්තනපිටිය, බොරලැස්ගමුව.

3. ලසන්ති නිරංජලා අමරසිරි ගුණවර්ධන,
අංක 18 1/1, බොතේජු පාර,
කොළඹ 05.

4. දමිතා අමරසිරි ගුණවර්ධන,
අංක 151/15, 1 වන පටුමග,
රත්තනපිටිය, බොරලැස්ගමුව.

5. සමන් ප්‍රශාන්ත වීරසිංහ,
   අංක 14, සුලෙයිමන් ටෙරස්,
   ජාවත්ත පාර, කොළඹ 05.

6. සුනිලා දර්ශනී ද අල්විස්,
   යටියන, අගලවත්ත.

7. දිලීප් සෙනියා ද අල්විස්,
   යටියන, අගලවත්ත.

8. රජීව් තිස්ස ද අල්විස්,
   යටියන, අගලවත්ත.

.................*පෙත්සම්කරුවෝ.*

කොළඹ 04, බෞද්ධාලෝක මාවත, අංක 102 හි තම ලියාපදිංචි කාර්යාලය පිහිටි ඒෂියා ලෙෂර් (ප්‍රයිවට්) ලිමිටඩ් Asia Leisure (Private) Limited (PV 17260) සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා 2023 මැයි මස 04 දින දරන පෙත්සමක් සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාත්බද මහාධිකරණයට ඉදිරිපත් කොට ඇති බවත්, එකී පෙත්සම පිළිබඳ විමසීම වර්ෂ 2023.08.29 වැනි දිනට නියම කර ඇති බවත්, එකී පෙත්සම සම්බන්ධව නියෝගයක් කිරීම සම්බන්ධයෙන් පාක්ෂික ව හෝ විරුද්ධ ව කරුණු දැක්වීමට අදහස් කරන එම සමාගමේ කවර හෝ ණය හිමියෙකුට හෝ දායකයෙකුට තම අදහස් වෙනුවෙන් එකී විමසීම කරන අවස්ථාවේ දී පෞද්ගලිකව හෝ ලේඛනගත නීතිඥවරයෙකු මගින් පෙනී සිට කරුණු දැක්විය හැකි බවත්, පෙත්සමේ පිටපතක් නියමිත ගාස්තු ගෙවීම මත එහි කවර හෝ ණයහිමියෙකු හෝ දායකයෙකුට පහත අත්සන් කරන නීතිඥතැනගෙන් ඉල්ලා සිටි විට ලබාගත හැකි බවත්, මෙයින් නිවේදනය කරනු ලැබේ.

නීතිඥ එම්. ජේ. එස්. ෆොන්සේකා,
අංක 171, බෝපිටිය, පමුණුගම.

***සටහන.-*** මෙම පෙත්සම විමසීමට ගන්නා අවස්ථාවේ දී පෙනී සිටීමට බලාපොරොත්තු වන කවර හෝ පුද්ගලයෙකු එසේ කිරීමට ඇති සිය අදහස ඉහත නම් සඳහන් නීතිඥ එම්. ජේ. එස්. ෆොන්සේකා වෙත ලිඛිතව දන්වා භාරදිය යුතුය. නැතහොත් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. දැනුම් දීම කරන පුදගලයාගේ නම සහ ලිපිනය ද, සමාගමක් වේ නම් සමාගමේ නම සහ ලිපිනය ද, දැන්වීමේ සඳහන් කළ යුතු අතර, පුද්ගලයා හෝ සමාගම විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ ලේඛනගත නීතිඥ විසින් අත්සන් කළ යුතු අතර, **2023.08.28 වැනි දින පස්වරු 4.00** ට පෙර භාර දිය යුතු ය. ලියාපදිංචි තැපැල් මගින් එවන්නේ නම් ඉහත සඳහන් නීතිඥතැනගේ ලිපිනයට 2023.08.28 දිනට පෙර ලැබෙන ලෙසට ප්‍රමාණවත් කාලයක් සහිතව එවිය යුතු ය.

එම්. ජේ. එස්. ෆොන්සේකා,
පෙත්සම්කරුවන්ගේ ලේඛනගත නීතිඥ.

07-402

---

## සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්ගෙන් බලපත්‍රයක් ලියාපදිංචි කිරීම පිණිස ඉල්ලුම් පත්‍රය
## APPLICATION FOR A LICENCE FROM THE REGISTRAR GENERAL OF THE COMPANIES

මෙම ඉල්ලුම්පත්‍රය ''අගසව් පදනම'' ("Agasav Foundation") යන නමින් සහ මාදිලියෙන් සීමිත වගකීම් සහිත සංවිධානයක් නමේ කොටසක් ලෙස ''සීමිත වගකීම් සහිත'' යන වදන් නොයොදමින් සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්ගෙන් බලපත්‍රයක් ලබා ගැනීම පිණිස ඉදිරිපත් කෙරෙන්නේ වසර 2007 සමාගම් පනතේ අංක 34 දරන වගන්තියට අනුව ය.

මෙම සංවිධානය ස්ථාපිත කිරීමේ දී යෝජිත අරමුණු පහත දැක්වෙන සේය.

අරමුණු : (Objectives)

1. සිංහල ජනතාවගේ බහුතර භාවයට විශේෂ අවධාරණයක් දෙමින් අප මව්බිමේ සිටිනා සුළු ජන කොටස්වල ඇතැම් අය විසින් ඒ බව වැළකීමට අවකාශ නොතබමින් සියලු ජනතාවගේ අභිමානය සහ ඉහළ මට්ටමේ ජීවන තත්ත්වයක් ඇතිවන සේ ජාතික සංහිඳියාවක්, දේශීය සහ විදේශීය වශයෙන් ස්ථාපිත කිරීමට අවශ්‍ය වන එක්සත් බව, යහපත් බව සහ ශක්තිය යොද ගනිමින්, අපගේ සාම්ප්‍රදයික දැනුම සහ තාක්ෂණයත් සහ අත්දැකීම් ද යොදගෙන, **එක් රටක්** යන මූලධර්මයෙන් පිරි සියලු සෞභාග්‍යයෙන් සපිරි රටක් ගොඩනැගීම පිණිස **එක් නීතියක් සහ එක් ශ්‍රී ලංකාවක්** යන තේමාව යටතේ එක් ශ්‍රී ලංකාවක් ලෙස රටේ කීර්ති නාමය ද රැකෙන සේ සහ මව්බිමේ ස්වාධීනත්වය රකිමින් සහ එයට එරෙහි වන්නන්ගෙන් රැකගැනීම.

2. වෘත්තීයමය ශ්‍රම සමූපකාර සමිති මගින් ස්වභාවිකව සහ සමාජීය වශයෙන් ක්‍රියාත්මක කළ හැකි, ශ්‍රී ලංකාව තුළ කෘෂිකාර්මික, කාර්මික සහ සේවාවලට අදළ සෑම ක්ෂේත්‍රයක ම නිරත වීම පිණිස නිපුණතා පුහුණු කටයුතුවල නීතිමය වශයෙන් ද අවසර ලබා ඇති, ඒ සියල්ල බෞද්ධ මූල ධර්මවලට අනිවාර්යෙන් එකඟ වෙමින් සහ ඒ අනුව එවන් කටයුතු සඳහා පමණක් මෙම පදනමෙන් සංවර්ධනාත්මක සහාය ලබාදෙන්නක් බවට පත් කිරීමට තෝරාගැනීම් සංවිධානය කිරීම, නිපුණතා ප්‍රවර්ධනය සහ නිපුණත්වය ලැබූවන්ට අවස්ථා සැලසීම.

3. ගොඩනැගිලි කර්මාන්තයේ, ලෝහමය නිර්මාණ කටයුතු, විදුලි සහ විද්‍යුත් සම්බන්ධිත, මෝටර් යාන්ත්‍රික අංශය, දැව ආශ්‍රිත නිපුණතා සහ වඩු කර්මාන්ත ක්ෂේත්‍රවල දැනුම වර්ධනය කිරීම.

4. සංස්කෘතිකමය අධ්‍යාපනය, සෞඛ්‍යය, කෘෂිකර්මාන්තය, යහපැවතුම්, ආගමික සංහිඳියාව, විශේෂයෙන් ම වෛද්‍ය ක්ෂේත්‍රයේ, කෘෂි කර්මාන්තයේ සහ කලා කටයුතු පිළිබඳව ඇති සාම්ප්‍රදයික සහ තාක්ෂණික දැනුම ඔසවා තබමින් ජනතාව අතර ප්‍රචලිත කිරීම.

5. පිරිසිදු ජලසම්පතින් මෙන් ම වෘක්ෂලතා සහ සත්ව සම්පතින් පිරි පරිසරය සුරකිමින් පිරිසිදු මෙන් ම හරිත වර්ණ රටක් ඇති කරගැනීමට ශ්‍රී ලාංකිකයන් දැනුවත් කිරීම.

6. සෞඛ්‍යය අධ්‍යාපන වැඩසටහන් මගින් විශේෂයෙන් ම මනා සෞඛ්‍යය දැනුමක් ඇති කිරීම මගින්, පිළිකා, වකුගඩු වැනි රෝගාබාධ මෙන් ම තැලසීමියා, ඩෙංගු හා එවන් රෝගාබාධ ගැන ජනතාව දැනුවත් කිරීම.

7. අපගේ පවත්නා නීති ක්‍රමයේ විශේෂ අවධානයක් දී ඇති ශ්‍රී ලංකාව තුළ ළමා සහ කාන්තා අයිතීන් වෙනුවෙන් අනුගත වෙමින් දිළින්දන් වෙනුවෙන් නීති ආධාර දෙමින් ''ජීවිතයට ඇති අයිතිය'' ධර්මය පිළිබඳ මානව අයිතීන් හා වෙනත් අයිතීන් ආරක්ෂාකිරීමට කැපවීම.

8. පදනමේ අරමුණු ඉටුකර ගැනීම සඳහා වැඩමුළු, පුහුණු වැඩසටහන් පැවැත්වීම, පොත්පත් මුද්‍රණය ආදී ප්‍රචාරණයට වැදගත් කටයුතු කිරීම.

9. රාජ්‍ය කටයුතු සහ තීරණ පිළිබඳව පොදු යහපත පිණිස ජාති හෝ ආගම් බේදයකින් තොරව සමාජයේ වින්දිතයන් මෙන් ම අසරණවූවන්ගේ නෛතික අයිතීන් රැක දීමට කටයුතු කිරීම ත් පදනමේ අරමුණකි.

මෙම ආයතනය ද්වීතියික අධ්‍යාපනය වෙනුවෙන් නොවේ.

අංක 130, මාලිගාකන්ද පාරේ, කොළඹ 10 හි දී අදළ වන සමාගමේ නියාමිත විස්තරව ඇත.

මෙමගින් දැනුම් දෙන්නේ, යම් පුද්ගලයෙකුට සමාගමක් හෝ සංස්ථාවකට මෙම ඉල්ලුම් පත්‍රයට විරෝධයක් ඇත්නම් එවන් විරෝධතා මෙම නිවේදනයෙන් සති තුනක් ඉකුත් වීමට මත්තෙන් ලේඛකාධිකාරී, සමාගම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය, අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10 ට යොමු කරන්න.

දිනය : 2023 ජුනි මස 25 දින.

එස්. පී. මොරවක ඇසෝසියේට්ස්
(පුද්ගලික) සමාගම,
සමාගම් ලේකම්වරු.

07-335

## ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

### ශ්‍රී ලංකා සෞඛ්‍ය පර්යේෂණ හා නවෝත්පාදන ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

උපුල් ගලප්පත්ති වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ අංක 53 (1) දරන ස්ථාවර නියෝගය යටතේ, ''ශ්‍රී ලංකා සෞඛ්‍ය පර්යේෂණ හා නවෝත්පාදන ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි'' යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී ආයතනය සංස්ථාගත කිරීමයි :-

(අ) වෛද්‍ය අධ්‍යාපනය සඳහා මඟ පෙන්වීමත්, මානව සම්පත් සංවර්ධනයෙහි සහ අධ්‍යාත්මික සෞඛ්‍යය ඇතුළු සෞඛ්‍ය ප්‍රවර්ධන ක්‍රියාකාරකම් හි නිරත වීම ;

(ආ) සෞඛ්‍ය පර්යේෂණ ප්‍රවර්ධන ක්‍රියාකාරකම් හා විද්‍යාත්මක නවීකරණය හා තිරසර සංවර්ධනය ආශ්‍රිත ක්‍රියාකාරකම් හි නිරත වීම ;

(ඇ) රෝගීන් සුවපත් කිරීම ආශ්‍රිත ක්‍රියාකාරකම් සංවර්ධනය හා වැඩි දියුණු කිරීම සහ සමාජ අධ්‍යාපනික ක්‍රියාකරුවන්ට හා සෞඛ්‍ය සේවාවන් හි නිරත පිරිසට පුහුණු වැඩසටහන් ලබා දීම මඟින් නායකත්ව හැකියා ප්‍රවර්ධනය කිරීම,

යනාදිය වේ.

වෛද්‍ය උපුල් ගලප්පත්ති,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
හම්බන්තොට දිස්ත්‍රික්කය.

07-295

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.